# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයයේ මහෝපාධ්‍යාය තනතුර

**<u>අයදුම්කරුවන් විසින් සම්පූර්ණ කළ යුතු මූලික සුදුසුකම්</u>**

1. සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලාංකික පුරවැසිභාවය සහිත, අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට වයස අවුරුදු 62 නොඉක්ම වූ උපසම්පදාවෙන් දසවස් සපිරි භික්ෂූන් වහන්සේ නමක් විය යුතු ය.
2. **i.** අයදුම්කරු අභ්‍යන්තර අයදුම්කරුවෙකු නම් ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයයේ ස්ථිර සේවයෙහි නියුතු, සම්මාන ආචාර්ය උපාධියක් නොවන ආචාර්ය උපාධියක් සහිත ධර්මධර, විනයධර භික්ෂූන් වහන්සේ නමක් විය යුතු ය.

   **ii.** බාහිර අයදුම්කරුවෙකු නම් බෞද්ධ හා පාලි අධ්‍යයන ක්ෂේත්‍රයේ විශිෂ්ට සුදුසුකම්වලින් යුතු, අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සම්මාන ආචාර්ය උපාධියක් නොවන ආචාර්ය උපාධියක් සහිත ධර්මධර, විනයධර භික්ෂූන් වහන්සේ නමක් විය යුතු ය.

**<u>අයදුම්පත්/ නාමයෝජනා ඉදිරිපත් කිරීමේ දී සැලකිය යුතු කරුණු</u>**

1. අයදුම්කරුගේ උපන් දිනය, උපසම්පදාවට පත් වූ දිනය, අධ්‍යාපන සුදුසුකම්, ශාස්ත්‍රීය පර්යේෂණ හා ප්‍රකාශන, ඉංග්‍රීසි හා වෙනත් විදේශ භාෂා දැනුම, වෘත්තීය හා පරිපාලන කටයුතු පිළිබඳ පළපුරුද්ද ඇතුළත් කරන ලද ජීව දත්ත පත්‍රිකාවක් අයදුම්පත සමඟ යොමු කළ යුතුය. (අයදුම්කරුගේ උපන් දිනය ද, උපසම්පදාවට පත් වූ දිනය ද නිවැරදි ව සටහන් කළ යුතු අතර උප්පැන්න සහතිකයේ හා උපසම්පදා සහතිකයේ සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතු ය.)

2. අයදුම්පත් යොමු කිරීමේ දී විශ්වවිද්‍යාලයේ ප්‍රගමනය සඳහා ඉදිරිපත් කරන දැක්ම පිළිබඳ ප්‍රකාශනය හා විශ්වවිද්‍යාලයේ මහෝපාධ්‍යායයන් වහන්සේ වශයෙන් තේරීපත් වුවහොත් විශ්වවිද්‍යාලයේ අරමුණු ලඟා කරගැනීමට කටයුතු කරන ආකාරය පිළිබඳ කෙටි විස්තරයක් ජීව දත්ත සමග වෙන වෙනම ඉදිරිපත් කළ යුතුය.

3. නාමයෝජනාවක් නම්, නාමිකයාගේ කැමැත්ත සහිත ලිපියක් යොමු කළ යුතුය.

4. අයදුම්කරු/නාමිකයන් රාජ්‍ය සේවය, සමාගමක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක සහ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයයේ හැර වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක සේවයෙහි නියුක්ත වන්නේ නම් අයදුම්කරු/නාමිකයා තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් උන්වහන්සේ සේවයෙන් නිදහස් කළ හැකි බවට සේවායෝජකයාගෙන් ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

**අයදුම්පත් එවීමේ දී,**

- ජීව දත්ත තොරතුරු හා අනෙකුත් තොරතුරුවල **මෘදු පිටපත් (PDF)**, **<u>registrar@bpu.ac.lk</u>** විද්‍යුත් ලිපිනයට එවිය යුතුය.

## <u>තෝරා ගැනීමේ ක්‍රමවේදය</u>

1. අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය වන 2025.01.27 දින ප.ව. 3.00 වනවිට ලැබී ඇති අයදුම්පත් අතරින් සුදුසුකම් සපුරා ඇති නිවැරදි අයදුම්පත් තෝරාගැනීම ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයීය පාලක සභාවේ සාමාජිකයින් තිදෙනෙකුන් යුත් කමිටුවක් මගින් සිදුකරනු ලබයි.

2. සුදුසුකම් ලත් අයදුම්කරුවන් විශේෂ පාලක සභාවක් වෙත කැඳවන අතර එහි දී එම අයදුම්කරුවන් විනාඩි 15කට සීමාවූ ප්‍රස්තුතීකරණයක් (Presentation) පාලක සභාව ඉදිරියේ සිදු කළ යුතු ය.

3. පත්කිරීම් සඳහා ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයීය 1995 අංක 37 දරන පනතින් සංශෝධිත 1981 අංක 74 දරන විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන අනුව හා මහෝපාධ්‍යායයන් වහන්සේනමක් පත්කරගැනීම සඳහා 438වන පාලක සභාව විසින් අනුමත නිර්ණායක ප්‍රකාරව අයදුම්කරුවන්/නාමිකයන් අතරින් භික්ෂූන් වහන්සේලා තුන් නමකින් සමන්විත මූල මණ්ඩලයක් පාලක සභාව විසින් තෝරාගෙන අධ්‍යාපන අමාත්‍යාංශය වෙත දන්වනු ලැබේ.

**මෙම මූල මණ්ඩලය තෝරාගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ තීරණය අවසන් තීරණය වේ.**

## <u>අයදුම්පත්/ නාමයෝජනා භාරගන්නා අවසාන දිනය හා වේලාව</u>

- 2025.01.27 දින ප.ව. 3.00ට

## <u>අයදුම්පත්/නාමයෝජනා ලබාගත හැකි ආකාරය</u>

- අයදුම්පත් හා නාමයෝජනා සඳහා විස්තර www.bpu.ac.lk වෙබ් අඩවියට පිවිසීමෙන් ද ලබා ගත හැක.

## <u>අයදුම්පත්/නාමයෝජනා යොමු කළ යුතු ආකාරය</u>

- අයදුම්පත්‍ර හෝ නාමයෝජනාවලට අදාළ ලේඛන බහාලන ලිපිකවරයේ ඉහළ වම් කෙළවරේ ***"මහෝපාධ්‍යායයන් වහන්සේ ධුරය"*** යනුවෙන් සඳහන් කළ යුතුය.

- අයදුම්පත්‍ර හෝ නාමයෝජනා **2025.01.27 දින ප.ව. 3.00ට හෝ ඊට ප්‍රථම "ලේඛකාධිකාරී, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, අංක 37, මොරගහහේන පාර, පිටිපන නගරය, හෝමාගම"** ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ පෞද්ගලිකව පැමිණ භාරදීම සිදුකළ හැකිය.

<u>**2025.01.27 දින ප.ව 3.00න් පසු ලැබෙන අයදුම්පත්‍ර හෝ නාමයෝජනා කිසිවක් විශ්වවිද්‍යාලය විසින් භාරගනු නොලැබේ.**</u>

ලේඛකාධිකාරී (වැඩබලන) හා පාලක සභා ලේකම්
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
හෝමාගම.
0112 891 105
2024.12.27